MWCE/5/4/3

2021.01.19

අතිරේක ලේකම් (පාලන)

අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා)

ප්‍රධාන මූල්‍ය නිලධාරී

අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්)

අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

අධ්‍යක්ෂ (සංවර්ධන)

අධ්‍යක්ෂ (වැ.බ.) - මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය

සභාපති/ විධායක අධ්‍යක්ෂ - ජාතික කාන්තා කමිටුව

සභාපති - ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

කොමසාරිස් (වැඩ ආවරණ) - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

ව්‍යාපෘති අධ්‍යක්ෂ - මුල් ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය

**"නැණ ප්‍රදීපණී" යහපත් සමාජයක් ඇති කිරීම සඳහා කියවීමේ පළපුරුද්ද හා අවස්ථා ප්‍රවර්ධනය කිරීමේ සමාජ සත්කාර වැඩසටහන ආරම්භ කිරීම.**

කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ මඟ පෙන්වීම යටතේ "නැණ ප්‍රදීපණී" නමින් ඉහත සමාජ සත්කාරක වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි. එහි ප්‍රමුඛ අරමුණ වන්නේ ජනතා දායකත්වය ලබා ගෙන විවිධ හේතූන් මත අධ්‍යාපනය හා දැනුම ලබා ගැනීමේ අවස්ථාවන් සීමාවීමකට ගොදුරු වී ඇති දරුවන් හා වැඩිහිටියන් සඳහා පරිශීලනයට අවශ්‍ය පොත්පත් එක්රැස් කර ලබා දීමයි.

ළමා නිවාස, කාන්තා රැකවරණ නිවාස, වැඩිහිටි නිවාස, දුෂ්කර තත්ත්වයේ පවත්නා පාසල් හා දිගු කාලීනව රෝහල් ගතව ප්‍රතිකාර ලබන රෝගීන් ඇතුළු පිරිස් මූලික ඉලක්ක කණ්ඩායම් වේ.

Planning Division

Bha/19/01/2021

මෙහි ආරම්භක පියවර වශයෙන් මෙම අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ දායකත්වය ඇතිව පොත්පත් රැස්කර ඉලක්ක පිරිසට පිරිනැමීමට තීරණය කර තිබේ. ඒ අනුව, 5වන මහලේ පිහිටි ලේකම් කාර්යාලයේ, රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් පොත් භාරගන්නා ඒකකයක් 2021.01.19 දින සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත.

මෙම කාර්යය සම්බන්ධයෙන් ඔබ අංශයේ කාර්යය මණ්ඩලයේ සියළු දෙනා දැනුවත් කරන ලෙසත්, ඔවුන් මගින් සමාජ සත්කාරයක් වශයෙන් අදාල පරිත්‍යාග එම ඒකකයට යොමු කරවීමටත් කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

තවද, ඔබ අංශය විසින් හෝ එසේ නොමැති නම් කාර්ය මණ්ඩලය පෞද්ගලිකව භාර දෙන පොත්පත් ලැයිස්තු ගත කර භාරගත් බවට ඔබ ආයතනය/ නිලධාරියා වෙත පිටපතක් ලබාදෙන අතර, සියළුම පොත්පත් භාරගැනීම හා අදාල ළමුන්/ ප්‍රතිලාභීන් වෙත ප්‍රදානය කිරීමේ ලේඛනයක් ඒකකය මගින් පවත්වා ගෙන යනු ලබයි.

සෑම වසරකම ලෝක ළමා දින ජාතික උත්සවයේ දී වැඩිම පොත්පත් සැපයීමෙන් දායකත්වය ලබා දෙන ආයතන හෝ පුද්ගලයින් වෙත "නැණ ප්‍රදීපණී" ස්වර්ණ සම්මානය පිරිනැමීමට අපේක්ෂිතය.

"නැණ ප්‍රදීපණී" වැඩසටහනේ සමාරම්භය මෙලෙස ක්‍රියාවට නැංවෙන අතර, අනතුරුව සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හරහා ද ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

මෙම වැඩසටහන පිළිබඳව වැඩිදුර දැනගැනීම සඳහා ඊට අදාලව සකස් කළ අත් පත්‍රිකාවේ පිටපතක් ද මේ සමඟ යොමු කරමි.

විවධ සීමා මායිම්වලට කොටුව දැනුම, තොරතුරු හා විනෝදාස්වාදය ලබා ගැනීමේ සීමාවන්ට යටවී සිටින දරුවන් ඇතුළු පිරිසට මෙම සත්කාරය සිදු කර, දීප්තිමත් සමාජයක් ගොඩ නැගීමට ඔබගේ නායකත්වයෙන් ඔබ අංශයේ කාර්යය මණ්ඩලය ලබා දෙන දායකත්වය අතිශයින් අගය කොට සලකමි.

අ/කලේ

එන්.එච්.එම්.ඩබ්.ඩබ්.නිල්මිණී හේරත්
අතිරේක ලේකම් (සංවර්ධන)

කේ.එම්.එස්.ඩී. ජයසේකර
රාජ්‍ය ලේකම්